දෙහිඕවිට ප්‍රාදේශීය සභාව,
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ලංකා බැංකුවේ පවත්වාගෙන යනුලබන ස්ථාවර තැන්පතු දෙකකට අදාලව සමාලෝචිත වර්ෂයට අදාල පොළී ආදායම රු. 156,691 ක් වුවත් එය රු.65,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට ආයෝජනවල වටිනාකම රු. 156,691 ක් හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 91,691 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුලින් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල නිවැරදි අතිරික්තය රු. 12,284,526 ක් වුවත් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ එය රු. 12,473,922 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවක ණය රු. 191,926 ක් හා කලින් ලද සේවක ණය රු. 3,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ජර්නල් සටහන් අංක 11 මගින් පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කලින් ලද වරිපනම් රු. 234,405 ක් වරෙන්තු ගාස්තු හා දඩ මුදල් ගිණුමට බැර කිරීම නිසා වරිපනම් බදු ආදායම රු.234,405 ක් අඩුවෙන් හා වරෙන්තු ගාස්තු හා දඩ මුදල් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුලින් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු ආදායම රු.115,060 ක් හා කලින් ලද වරිපනම් බදු ආදායම රු. 240,247 ක් බැගින් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.125,187 ක් වැඩියෙන් ද, 2015 දෙසැම්බර් 31 ට ආදායම් ණයගැතියන්ගේ වටිනාකම රු.115,060 ක් හා කලින් ලද ආදායම්වල වටිනාකම රු. 240,247 ක් බැගින් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශන තුලින් දක්වා තිබුණි.

(ඊ) ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි 2015 දෙසැම්බර් 31 දිනට නිවැරදි ශේෂය රු. 451,145,535 ක් වුවත් එය රු. 836,045,986 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.384,900,451 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්

ගිණුම් විෂයන් 04 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 7,741,071 ක් වූ අතර, ඒවාට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ශේෂයන් රු. 7,488,622 ක් වූයෙන් රු. 252,449 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

2009 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වූ රු.45,552 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙනුවෙන් 2010/11 වර්ෂ වලදී රැස්කල එකතු කළ අගය මත බදු තැන්පත්, ජාතිය ගොඩනැගීමේ බදු හා රැඳවුම් බදු එකතුව රු. 3,015,033 ක මුදල 2016 මැයි 31 දින දක්වාම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු ගිණුම් වල දක්වා තිබුණි.

(ආ) වර්ෂ 1989 හා 1992 සිට පැවත එන හිඟ කසළ බදු, වෙළඳපොළ කඩකුලී හා දඩ, මස්කඩ මාළුකඩ හා දඩ එකතුව රු.102,446 අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ලැබිය යුතු ශේෂය යටතේ දක්වා තිබුණි.

1.3.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය රීති 59 | සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර, වෘත්තීන් හා කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. මු.රෙ. 371 | 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවා තිබු එකතුව රු. 1,377,523 ක තත්කාර්ය අතුරු අග්‍රිම 04 ක් 2016 මැයි 31 දක්වාම පියවා නොතිබුණි. |

| | |
|---|---|
| II. මු.රෙ. 396 | නිකුත් කල නමුත් මාස 06 ක් තුල ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද වටිනාකම රු. 160,866 ක චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට වැඩ තහනමට ලක්වූ හා ස්ථාන මාරු වීම් ලබාගිය සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.75,526 ක ණය ශේෂය අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජූලි 20 දිනැති අංක 02/2011 චක්‍රලේඛය | පළාත් පාලන ආයතන විසින් බඳවා ගනු ලබන අනියම්, තාවකාලික, ආදේශක හා දෛනික වැටුප් ලබන සේවකයින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක කර නොගැනීම මත සේවකයින් 07 දෙනෙකුට අදාලව සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල වෙත රු. 49,889 ක් ගෙවා තිබුණි. |
| (ඉ) සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2005/04 හා 2005 ජූනි 01 දිනැති චක්‍ර ලේඛය | ඉඩම් කට්ටිකර විකිණීමේදී බිම් කොටස්වල තාවකාලික තක්සේරුවක් මත 1 %ක් ලබාගෙන ඉන්පසු විකුණන ලද ඉඩම්වල විකුණම් වටිනාකම මත 1 % ක බදු මුදලක් අයකල යුතු වුවත් කට්ටි කරන ලද ඉඩම් දෙකක බිම් කොටස්වල තාවකාලික තක්සේරුව මත රු.576,125 ක 1 % ක බදු මුදලක් අය කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම වූ රු.13,493,328 ක් වූ අතර, ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම වූ රු.8,591,446 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපලයේ රු.4,901,882 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,901,882 ක වර්ධනයකට ආදායම් වර්ෂයන් 03 ක වැඩිවීම හා වියදම් විෂයන් 5 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි..

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

(අ) ලේකම්වරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම තත්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය<br>--------------- | 2015.01.01 දිනට හිඟය<br>---------------<br>රු. | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම<br>----------------<br>රු. | 2015 වර්ෂයේ බිල් කිරීම<br>----------------<br>-<br>රු. | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම<br>----------------<br>රු. | 2015.01.01 දිනට පැවති හිඟයෙන් හිඟ<br>---------------<br>රු. | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය<br>---------------<br>රු. | මුළු හිඟය<br>-------------<br>රු. |
|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 5,723,698 | 935,036 | 3,271,534 | 1,610,919 | 4,788,662 | 1,660,615 | 6,449,277 |
| බදු කුලී | 77,401 | - | 3,448,191 | 2,911,086 | 77,401 | 537,105 | 614,506 |
| බලපත්‍ර ගාස්තු | 114,908 | - | 397,025 | 397,025 | 114,908 | - | 114,908 |
| වෙනත් ආදායම් | 19,720,895 | 17,273,045 | 40,046,737 | 24,193,672 | 2,447,850 | 15,853,066 | 18,300,916 |

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු වලට අදාලව අයවැය ගත ආදායම, බිල්කල ආදායම ලෙස සලකා ගිණුම් ගත කිරීම නිසා ලේකම් වරිය විසින් ඉදිරිපත් කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට හිග ආදායම් වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන ණයගැතියන් අතර රු.58,388 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3.2 <u>පරිසර බලපත්‍ර ගාස්තු</u>

1988 අංක 56 හා 2000 අංක 52 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 49 දරන පාරිසරික පනත ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 02 ක් විසින් පරිසර බලපත්‍ර ලබා නොගැනීම මත රු. 8,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.3.3 <u>දැන්වීම් පුවරු ගාස්තු</u>

සභා බලප්‍රදේශය තුල සවි කර ඇති ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 18 කින් වර්ග අඩියකට රු. 50 බැගින් රු. 22,100 ක මුදලක් අය කර නොතිබුණි.

2.3.4 <u>ව්‍යාපාර බදු</u>

(අ) සභා බලප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති දුරකථන සමාගම් 04 කට අයත් දුරකථන කුළුණු 07 කින් රු.21,000 ක ව්‍යාපාර බදු මුදල් අය කර නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් මත ගාස්තු අයකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල වෙළඳ ව්‍යාපාර 36 කින් රු.18,000 ක මුදලක් ව්‍යාපාර බදු ලෙස අයකර නොතිබුණි.

2.3.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| I. | උසාවි දඩ ආදායම | 7,697,925 |
| II. | මුද්දර ගාස්තු ආදායම | 8,154,878 |

2.3.6 මාළු කඩ බදු

----------------

තල්දූව සතිපොල භූමියෙහි ඉදිරිපස කොටසේ අනවසර ජංගම මාළු වෙළඳහල් 09 ක් හා පොළ භූමියේ ස්ථිරව ඉදිකරන ලද අනවසර මාළු වෙළඳ සැල් 02 ක් නිසා සභාව සතු තල්දූව සති පොළෙහි ඇති මාළු වෙළඳ සැලෙහි මාළු අලෙවි නොවන නිසා එහි පළමු ටෙන්ඩර්කරු විසින් මාසිකව ටෙන්ඩර් ගාස්තුව වන රු.17,583 ක් ගෙවා නොතිබුණි. 2013 මාර්තු මස මාළු කඩය සභාවට පවරාගෙන තිබුණු අතර ඒ අනුව මාස 09 කට අදාලව රු. 158,247 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

2.3.7 පෙරසැරි ගාස්තු

------------------

දුරකථන සමාගම් 04 කට අයත් සභා බලප්‍රදේශය තුල ස්ථාපිත කරන ලද දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 05 ක් මත රු. 116,000 ක පෙරසැරි ගාස්තු අයකර නොතිබුණි.

2.3.8 යන්ත්‍ර කුලි

------------

(අ) 2014 වර්ෂයේදී JCB යන්ත්‍රය මගින් කරන ලද වැඩ යන්ත්‍ර පැය 38.7 ක් වෙනුවෙන් රු. 96,750 ක මුදලක් අයකල යුතු වුවත් රු. 41,760ක මුදලක් පමණක් අයකර තිබුණු බැවින් රු.54,990 ක මුදලක් අඩුවෙන් අයකර නොතිබුණි.

(ආ) JCB යන්ත්‍රය කුලියට දීමෙන් පසුව කාල ප්‍රමාදයකින් තොරව ගාස්තු අයකල යුතු වුවත් 2014 හා 2015 වර්ෂයන් තුලදී දින 12 ක් තුල සිදු කරන ලද යන්ත්‍ර පැය 54.9 ක් වෙනුවෙන් ගාස්තු අයකිරීමේදි දින 10 දිට සිට මාස 03 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයක් තිබුණි.

(ඇ) JCB යන්ත්‍රය කුලියට දීමට ප්‍රථමයෙන් අදාල පර්ශවයන්ගෙන් තැන්පත් මුදලක් අයකල යුතු වුවත් 2014 වර්ෂයේදී දින 08 ක් තුල සිදු කරන ලද යන්ත්‍ර පැය 244 ක් වෙනුවෙන් තැන්පත් මුදල් අයකර නොතිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>අවිධිමත් ගණුදෙනු</u>

(අ) කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව සභාව සතු JCB යන්ත්‍රයේ යන්ත්‍ර ක්‍රියාකරුගේ දෛනික සාමාන්‍ය සේවක කාලය පැය 09 ක් වුවත් 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සාමාන්‍ය සේවා කාලය වන පැය 09 කට වඩා අඩුවෙන් සේවය කරන ලද දින 199 ක් තුල යන්ත්‍ර පැය 1021 ක් වෙනුවෙන් එක් යන්ත්‍ර පැයකට රු.200 බැගින් රු. 204,200 ක මුදලක් යන්ත්‍ර ක්‍රියාකරුට දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) 2013 ජූනි මස සිට 2014 දෙසැම්බර් මස දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් එක් යන්ත්‍ර පැයකට රු. 200 බැගින් යන්ත්‍ර පැය 2076.2 ක් සඳහා රු.415,240 ක මුදලක් JCB යන්ත්‍රයේ ක්‍රියාකරු දීමනාවක් ලෙස ගෙවා තිබුණි. මෙම කාල පරිච්ඡේදය සඳහා දින 534 ක් වෙනුවෙන් රු.488,418 ක මුදලක් දෛනික වැටුප් වශයෙන්ද ගෙවා තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2014 හා 2015 වර්ෂයන් තුල සභාව සතු අංක ZA – 0126 දරන JCB යන්ත්‍රයේ ආදායම රු. 1,573,320 ක් වූ අතර එහි මෙහෙයුම් වියදම රු. 4,114,306 ක් වූයෙන් රු. 2,540,986 ක සභා අරමුදලට මෙහෙයුම් පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) සබරගමුව පළාත් සභාවෙන් හා ලේකම් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගෙන් සභාවට ලැබී තිබූ වටිනාකම රු. 9,912,220 ක් වූ වාහන 07 ක අයිතිය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 නිශ්ක්‍රීය වත්කම්

සභාව සතු කැබ් රථ දෙකක් , ට්‍රැක්ටර් රථයක් හා පීඩන තලනයක් පිළිවෙලින් 2015 ,2010 හා 2014 වර්ෂවල සිට අක්‍රියව පැරණි සභා භූමිය තුල නිෂ්කාරියව පැවතුනි.

3.4 කසල බැහැර කිරීම.

සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු නොලබන අතර සභා බලප්‍රදේශය තුලින් එකතු කරනු ලබන කැලි කසළ තල්දූව පොළ භූමියේ වලවල් කපා අවිධිමත් ආකාරයට බැහැර කරනු ලැබේ.

04. ගිණුම කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛණයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැය විෂයන් 07 ක එකතුව රු. 1,418,000 ක ප්‍රතිපාදන වලින් 100% ක්ද වැය විෂයන් 07 ක එකතුව රු. 1,946,246 ප්‍රතිපාදන වලින් 56% ත් 96% ත් අතරද වශයෙන් එකතුව රු. 3,364,246 ක් සභා කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය